## 08. 2020 යල කන්නය සඳහා වගා කාල සටහන තීරණය කිරීම-උස්ගල සියඹලාන්ගමුව ව්‍යාපාරය

1994 අංක 13 දරණ සංශෝධන පනත යටතේ 05 වන වගන්තියේ 05 වන උප වගන්තිය ප්‍රකාරව උස්ගල සියඹලාන්ගමුව මහාවාරි ව්‍යාපාරය වෙනුවෙන් සහභාගී වූ ගොවි සංවිධාන නියෝජිතයින් සමග සාකච්ඡාකර 2020 යල කන්නය සඳහා පහත පරිදි වගා කාලසටහන සකස් කර ගන්නා ලදි

| අනු අංකය | විස්තරය | තීරණ |
| --- | --- | --- |
| 01 | වගා කිරීමට අපේක්ෂිත බිම් ප්‍රමාණය | අක්කර 2200 |
| 02 | වගාකිරීමට අපේක්ෂිත බෝග වර්ගය | වී අක්කර 1950<br>අතිරේක බෝග අක්කර 250 |
| 03 | වගාව පිහිටුවන ආකාරය | වාරි ජලයෙන් |
| 04 | ගොවීන් විසින් ඇළ වෙළි නඩත්තු අවසන් කලයුතු දිනය | 2020/03/16 |
| 05 | ගොවීන් විසින් නියමිත දිනට නඩත්තු නොකරනු ලැබූ අළවල් ගොවි සංවිධානය විසින් නඩත්තු කටයුතු අවසන් කළ යුතු දිනය | 2020/03/18 |
| 06 | වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් නඩත්තු කටයුතු ප්‍රධාන ඇළවල්වල හා ගොවි සංවිධාන විසින් නඩත්තු කටයුතු බෙදුම් ඇළවල්වල නඩත්තු කටයුතු අවසන් කළ යුතු දිනය | 2020/03/18 |
| 07 | කිරි ඉතිරවීමේ මංගල්‍යය | 2020/03/18 |
| 08 | මුල් වරට ජලය නිකුත් කිරීමට යෝජිත දිනය | 2020/03/20 |
| 09 | වපුරා හෝ බීජ සිටුවා අවසන් කළ යුතු දිනය | 2020/04/10 |
| 10 | මුර ජලය ආරම්භ කරන දිනය | 2020/04/10 |
| 11 | අවසන් වරට ජලය නිකුත් කිරීමට යෝජිත දිනය | 2020/07/05 |
| 12 | යායෙන් ගවයින් ඉවත් කළ යුතු දිනය | 2020/04/10 |
| 13 | වගා රක්ෂණය අවසන් කළ යුතු දිනය | 2020/04/10 |
| 14 | වගා හානි දැනුම් දිය .යුතු අවසන් දිනය | 2020-07-05 |
| 15 | අස්වනු නෙලා අවසන් කළ යුතු දිනය | 2020-07-30 |

"2020 යල කන්නයේ උස්ගල ව්‍යාපාරයේ වාරි ඉඩම්වල දුම්කොළ වගා නොකිරීමට තීරණය කරන ලදි."

1994 අංක 13 දරණ වාරිමාර්ග (සංශෝධන) පණතේ 11 වන උප වගන්තිය අනුව ඉදිරි කන්නයේ කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා යෝජිත වගා රීති

වගා කොන්දේසි

1. කෙත් ඇල සහ බෙදුම් ඇලවල නඩත්තුව සඳහා කන්නයකට අක්කර 01ක් සඳහා රු.300.00ක මුදලක් ගොවි සංවිධානයට සංවර්ධන අරමුදල් වශයෙන් ගෙවිය යුතුය.

2. නියමිත දිනට කෙත් ඇලවල් හා බෙදුම් ඇලවල් ගොවීන් විසින් නඩත්තු කළ යුතු අතර නියමිත දිනට නඩත්තු නොකරන කොටස් සඳහා ගොවි සංවිධානය මගින් නඩත්තු කර මීටරයට රුපියල් 150 බැගින් ගොවින්ගෙන් අය කර ගැනමට ගොවි සංවිධානයට බලය පැවරේ.

3. ගවයින් නිසා වගාවට සිදු වන හානි ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ මැදිහත් වීමෙන් හානි පූර්ණය කර ගත යුතුයි.වාරිමාර්ග පද්ධතියට සිදු වන හානි සඳහා අලාභය තක්සේරු කර අය කර ගැනීමට බලය පවතී.

4. වගා රැස්වීමේ තීරණ වලට පටහැනිව ජලය ලබා ගැනීම හා වාරිමාර්ග නිර්මිතවලට හානි කිරීම සිදු කළ හොත් වාරි මාර්ග පනතට අනුව දඩය අය කිරීමටත් එසේම එම හානිය වාරිමාර්ග දෙපාර්තමේන්තුව මඟින් තක්සේරු කර තක්සේරු වටිනාකම අය කර ගැනීමටත් ගොවි සංවිධානයට බලය පැවරේ.

5. අනවසරයෙන් ජලය ලබා ගැනීම වරදක් වන අතර එසේ ලබා ගත් ජලය වෙනුවෙන් වාරිමාර්ග දෙපාර්තමේන්තුව මගින් අයවිය යුතු වටිනාකම තක්සේරු කර අදාළ වරදකරුගෙන් අය කර ගැනීමට ගොවි සංවිධානයට බලය පැවරේ.

6. අනවසරයෙන් හෝ බලහත්කාරයෙන් ජල පොම්ප භාවිතයෙන් වාරි ජලය ලබා ගෙන රක්ෂිත හෝ ගොඩ ඉඩම් හෝ අනවසර ඉඩම් වගා කිරීම සම්පූර්ණයෙන් තහනම් වේ.

ඒ අනුව 2020 යල කන්නය සඳහා ඉහත සඳහන් වගා කාල සටහන හා වගා රීති සුදුසු බවට D1 ගොවි සංවිධානයේ ගරු ගරු සභාපති මහතා විසින් කළ යෝජනාව D2 ගොවි සංවිධානයේ ගරු භාණ්ඩාගාරික මහතා විසින් ස්ථිර කරන ලදි.

අතිරේක දිස්ත්‍රික් ලේකම්තුමා අදහස් දක්වමින් ඉහත දින වකවානුවල හා තීරණවල යම් වෙනසක් කිරීමක් සිදුකිරීමට අවශ්‍ය වුවහොත් ඒ සඳහා ව්‍යාපාර කමිටුවට බලය පවරා දෙන බවට පවසන ලදි . මින් අනතුරුව , කන්න රැස්වීමේ කටයුතු අවසන් කිරීමට ඒකාබද්ධ ගොවි සංවිධානයේ සභාපති තුමන්ට අවස්ථාව ලබාදෙන ලදි .

ඒකාබද්ධ ගොවි සංවිධානයේ ගරු සභාපතිතුමාගේ ස්තුති කතාවෙන් පසුව ප.ව 1.00 ට පමණ කන්න රැස්වීමේ කටයුතු අවසන් කරන ලදි .

............................

ජී . ඒ කිත්සිරි
අතිරේක දිස්ත්‍රික් ලේකම්
කුරුණෑගල .

ජී.ඒ. කිත්සිරි
අතිරේක දිස්ත්‍රික් ලේකම් (සංවර්ධන)
දිස්ත්‍රික් ලේකම් කුරුණෑගල වෙනුවට

පිටපත් : -
01.අධ්‍යක්ෂ වාරිමාර්ග කළමනාකරණ අංශය කොළඹ :-කා.දැ.ස